# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

## 2002 අංක 24 දරන
## සුබසාධක ප්‍රතිලාභ පනත

[සහතිකය සටහන් කළේ 2002 ඔක්තෝබර් මස 22 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

2002 ඔක්තෝබර් මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 10.75 ශ.          තැපැල් ගාස්තුව : රු. 6.75 ශ.

# 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනත

[සහතිකය සටහන් කළේ 2002 ඔක්තෝබර් මස 22 වන දින]

එල්. ඩී.—ඕ. 26/2002.

සියලු සුබසාධක සහනාධාර ප්‍රතිලාභ ගෙවීම සඳහා අවශ්‍ය නෛතික පාදක ව්‍යුහය සැලැස්වීම සඳහා ද ; ඒ ප්‍රතිලාභ ලබන්නන් හඳුනාගැනීමට හැකි වන විනිවිද ස්වභාවයේ තේරීම් ක්‍රියාවලියක් ඇතිකිරීම පිණිස ද ; ඒ ප්‍රතිලාභ අවසන් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

1. මේ පනත 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

නිලධරයන් පත් කිරීම.

2. මේ පනතේ කාර්ය සඳහා මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු-

(අ) (මෙහි මින් මතු "කොමසාරිස්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) නමින් හෝ ධුරයෙන් සුබසාධක ප්‍රතිලාභ කොමසාරිස්වරයා වීම පිණිස තැනැත්තෙක් ; සහ

(ආ) මණ්ඩලයේ සාමාජිකයන් හතර දෙනෙක් ද ; සහ

(ඇ) අවශ්‍ය විය හැකි පරිදි, අතිරේක සුබසාධක ප්‍රතිලාභ කොමසාරිස්වරුන්, නියෝජ්‍ය සුබසාධක ප්‍රතිලාභ කොමසාරිස්වරුන් සහ සහකාර සුබසාධක කොමසාරිස්වරුන් වීම පිණිස නමින් හෝ ධුරයෙන් තැනැත්තන් යම් සංඛ්‍යාවක් ද ,

පත් කරනු ලැබිය යුතු ය.

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය පිහිටුවීම.

3. (1) මේ පනතේ කාර්ය සඳහා, පනත පරිපාලනය කිරීම සහ මේ පනතින් මණ්ඩලය වෙත වෙන්කර දෙන්නා වූ හෝ පැවරෙන්නා වූ බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය හා කර්තව්‍ය ඉටුකිරීම භාරකෙරෙන (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලබන මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලය සංස්ථාවක් වන අතර එයට ඓවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තවද, මණ්ඩලය විසින් ද මණ්ඩලයට විරුද්ධව ද එම නාමයෙන් නඩු පවරනු ලැබිය හැකි ය.

මණ්ඩලයේ සංයුතිය.

4. (1) මණ්ඩලය–

(අ) මණ්ඩලයේ සාමාජිකයන් අතුරින් 2 වන වගන්තියේ (අ) ඡේදය යටතේ පත් කරනු ලබන සභාපතිවරයා විය යුතු සුබසාධක ප්‍රතිලාභ කොමසාරිස්වරයාගෙන් ; සහ

(ආ) අමාත්‍යවරයා විසින් 2 වන වගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරනු ලබන සාමාජිකයන් හතර දෙනෙකුගෙන්

සමන්විත විය යුතු ය.

(2) මණ්ඩලයේ සභාපතිවරයා සහ සාමාජිකයන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විමසා අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය. (1) වන උපවගන්තිය යටතේ සභාපතිවරයා සහ සාමාජිකයන් හතර දෙනා පත් කිරීමේ දී එම තැනැත්තන් තෝරා ගැනීමෙහි ලා අනුගමනය කළ යුතු උපමාන සම්බන්ධයෙන් අමාත්‍යවරයා සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව එකඟත්වයට එළඹිය යුතු ය.

(3) කොමසාරිස්වරයා මණ්ඩලයේ ප්‍රධාන පරිපාලන නිලධරයා විය යුතු අතර ඔහු මණ්ඩලයේ සියලු තීරණ ක්‍රියාවේ යෙදවීම සඳහා ද මණ්ඩලය විසින් ඔහු වෙත පවරා දෙනු ලබන හෝ මෙම නීතියෙන් හෝ ඒ යටතේ ඔහු වෙත පවරා දෙනු ලබන හෝ වෙන් කර දෙනු ලබන යම් බලතල ක්‍රියාත්මක කිරීම හෝ කර්තව්‍ය ඉටුකිරීම සඳහා ද වගකිව යුතු ය.

මණ්ඩලයේ ධුර කාලය ආදිය.

5. (1) 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරන ලද සභාපතිවරයාගේ සහ එක් එක් සාමාජිකයාගේ ධුර කාලය, ඔවුන්ගේ පත්වීමේ දිනයේ සිට ගණන් බලන ලද අවුරුදු තුනක කාලයක් විය යුතු ය.

(2) ඉහත නිශ්චිතව සඳහන් ධුර කාලය ඉක්මවා යාමට පෙරාතුව අමාත්‍යවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විමසා, සභාපතිවරයා හෝ මණ්ඩලයේ යම් සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

අනුව කරනු ලැබිය යුතු ය. හුදෙක් ජවතිය ජාතිය, භාෂාව, ආගම, ලිංගිකත්වය හෝ දේශපාලන මතය හේතුකොට ගෙන පමණක්, මේ පනත ප්‍රකාරව සුබසාධන ප්‍රතිලාභ ගෙවීම් ලැබීම පිණිස සුදුසු තැනැත්තකු ලෙස තෝරා ගනු ලැබීම හිමිය තැනැත්තකු සම්බන්ධයෙන් ප්‍රතික්ෂේප නොකළ යුතු ය :

එසේ වුව ද, නිසියම් මහජනාධාර යෝජනා ක්‍රමයක් යටතේ හෝ දරිද්‍රතාවය තුරන් කිරීම පිණිස අරමුණු කරගත් වෙනත් යම් කාර්යයක් සඳහා තත් කාලයේ බලාත්මකව පවත්නා යම් නීතියක විධිවිධාන ප්‍රකාර මාසිකව හෝ අන්‍යාකාරව දීමනාවක් හෝ ගෙවීමක් ලබන යම් තැනැත්තකු විසින් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වී මාස තුනක කාලයක් තුළ දී, (3) වන උපවගන්තිය ප්‍රකාර සැපයීමට නියම කරනු ලැබ ඇති තොරතුරු ද සමග, එසේ ලබන දීමනාව හෝ ගෙවීම පිළිබඳ සියලු විස්තර කොමසාරිස්වරයා වෙත දැනුම් දිය යුතු ය. එම නිවේදනය සහ තොරතුරු ලැබීමෙන් පසු, මේ පනත ප්‍රකාරව ආධාර ලැබීම පිණිස එම තැනැත්තාගේ සුදුසුකම් නියමිත උපමාන අනුව දැනගැනීමට ඉවහල් වීම පිණිස මණ්ඩලය විසින් එහි වූ කරුණු සමාලෝචනය කළ යුතු ය. නියමිත උපමානවලට අනුව, යම් තැනැත්තකුගේ සුදුසුකම් තහවුරු වූ අවස්ථාවක දී, එම තැනැත්තා මේ පනත ප්‍රකාරව මාස දොළහක මූලික කාලසීමාවක් සඳහා සුබසාධන ප්‍රතිලාභ ගෙවීම් ලැබීම පිණිස සුදුසු තැනැත්තකු බවට පලකනු ලැබිය යුතු අතර, ඒ බව කොමසාරිස්වරයා විසින් ඒ තැනැත්තා වෙත දැනුම් දිය යුතු ය. ඒ කාලසීමාව අවසානයේ දී ඒ තැනැත්තාට සුදුසුකම් ඇත්නම්, මේ පනතේ නියම අනුව සුබසාධන ප්‍රතිලාභ යෝජනා ක්‍රමයකට ඇතුළත්වීම සඳහා නැවත ඉල්ලුම්කර වීමට ඔහු සුදුස්සකු වන්නේ ය. සුදුසුකම් ලැබුවේ නම්, එම තැනැත්තාගේ නම, මේ පනතේ ප්‍රකාරව සුබසාධන ප්‍රතිලාභ ගෙවීම් ලැබීම පිණිස සුදුසු තැනැත්තන්ගේ නාම ලේඛනයට එකතු කළ යුතු ය. තව ද, ඒ අනුව කොමසාරිස්වරයා විසින් ඔහු වෙත ඒ බව දන්වා සිටිය යුතු ය :

එසේම, තවදුරටත් එවැනි යම් තැනැත්තකු එම සුබසාධන ප්‍රතිලාභ ගෙවීම් ලැබීමට ඉදිරියටත් සුදුසු නොවන බවට මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අවස්ථාවක දී කොමසාරිස්වරයා විසින් ඒ අනුව ඒ තැනැත්තා වෙත දැනුම් දිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් කළ පසු යම් තැනැත්තකු මේ පනතේ ප්‍රකාරව සුබසාධන ප්‍රතිලාභ ගෙවීම් ලැබීම පිණිස සුදුසු තැනැත්තකු ලෙස නියමිත උපමානවලට

අනුකූලව පිළිගනු ලැබූ විට, කොමසාරිස්වරයා විසින් ඒ බව වහාම දැනුම් දිය යුතු ය. යම් මහජනාධාර යෝජනා ක්‍රමයක් යටතේ හෝ දරිද්‍රතාවය තුරන් කිරීම පිණිස අරමුණු කරගත් හෝ වෙනත් යම් කාර්යයක් සඳහා තත් කාලයෙහි බලාත්මකව පවතින යම් නීතියක විධිවිධාන ප්‍රකාර ඒ තැනැත්තාට කරනු ලබන සියලු ගෙවීම් හෝ ඔහු විසින් ලබාගන්නා සියලු ප්‍රතිලාභ වහාම ක්‍රියාත්මක වන පරිදි අවසන් විය යුතු ය.

(3) මේ වගන්තියේ ඉහත කී විධිවිධාන ප්‍රකාරව සුබසාධන ප්‍රතිලාභ ගෙවීම් ලබාගැනීම පිණිස ඉල්ලුම්කරන සෑම තැනැත්තකු විසින් ම, අවස්ථාවෝචිත පරිදි ඒ තැනැත්තාගේ, ඔහුගේ කලත්‍රයාගේ, යැපෙන දරුවන්ගේ හෝ වෙනත් යැපෙන්නන්ගේ ආදායමට, වත්කම්වලට හා බැරකම්වලට අදාළ වූ තොරතුරු දක්වා සිටිමින් තත් කාර්යය සඳහා නියමිත ආකෘතියකින් හා ආකාරයෙන් වූ ප්‍රකාශනයක් කොමසාරිස්වරයා වෙත කරනු ලැබිය යුතු ය. ඒ ප්‍රකාශනයේ දක්වා ඇති තොරතුරු, යම් නියමිත සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් යෝජනා ක්‍රමයක් ප්‍රකාරව සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීමට තැනැත්තකු සුදුසු වන්නේ දැයි පරීක්ෂාකර බැලීම සඳහා මණ්ඩලය විසින් යොදා ගනු ලැබිය යුතු ය.

(4) ඒ තොරතුරුවලට අදාළව සිදුව ඇති යම් වැදගත් වෙනස්වීමක් ඒ වෙනස්වීම සිදු වී මාස දෙකක කාලසීමාවක් තුළ දී ඒ බව කොමසාරිස්වරයා වෙත දැනුම් දීම (1) වන උපවගන්තිය ප්‍රකාරව කොමසාරිස්වරයා වෙත දැනුම්දීම කර ඇති හෝ (3) වන උපවගන්තිය ප්‍රකාරව තොරතුරු සපයා ඇති තැනැත්තකුගේ කාර්යය වන්නේ ය.

(5) මේ පනත ප්‍රකාරව සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීම පිණිස සුදුසුකම් ඇති ලෙස තෝරා ගනු ලැබූ තැනැත්තකු මෙහි මින් මතු "මේ පනත අදාළවන තැනැත්තා" යනුවෙන් සඳහන් කරනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ වූ මණ්ඩලයේ තීරණයක් අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය.

මණ්ඩලයේ බලතල පැවරීම.

8. (1) මේ පනතේ විධිවිධාන සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා මණ්ඩලය විසින් ඒ වෙත පැවරී ඇති යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය පනතේ 2 වන වගන්තියේ (ඇ) ඡේදයේ නිශ්චිතව සඳහන් නිලධරයන්ගෙන් යම් නිලධරයකුට හෝ යම් දිසා ලේකම්වරයකුට, ප්‍රාදේශීය ලේකම්වරයකුට හෝ ග්‍රාම නිලධාරියකුට හෝ රජයේ නිලධරයකුට පවරා දිය හැකි ය.

(2) එම බලය පැවරීම තිබුණේ වී නමුදු ඒ ගැන නොතකා මණ්ඩලය විසින්, එසේ පවරා දෙනු ලැබූ යම් බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම කරනු ලැබිය හැකි අතරම එම බලය පැවරීම කවර හෝ වේලාවක ඉවත් කර ගැනීම ද කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ යම් බලතල පවරා දෙනු ලැබූ තැනැත්තන් විසින් ඔවුන් වෙත එලෙස පවරා දෙනු ලැබූ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්ය හා කර්තව්‍ය ඉටුකිරීමේ දී කොමසාරිස්වරයාගේ සාමාන්‍ය විධානයට හා පාලනයට යටත් විය යුතු ය.

සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය.

9. (1) මේ පනත අදාළවන තැනැත්තන් වෙත කරනු ලබන සියලු සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ඇතිව සහ අදාළ විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පරිදි වූ සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමවලට අනුකූලව විය යුතු ය.

(2) එක් එක් යෝජනා ක්‍රමයෙහි, යෝජනා ක්‍රමයක ප්‍රකාරව ආධාර ලැබීම පිණිස තිබිය යුතු සුදුසුකම් සඳහා උපමාන, යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනය, එම යෝජනා ක්‍රමය ප්‍රකාරව ප්‍රදානය කිරීමට යෙදෙන මූල්‍ය හෝ වෙනත් ප්‍රතිලාභ, යෝජනා ක්‍රමය ප්‍රකාරව ප්‍රතිලාභ ලැබීමට තැනැත්තන් හිමිකම් ලබන කාලසීමාව සහ එම යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබන්නන් වන තැනැත්තන්ගේ මුළු සංඛ්‍යාව, සහ යෝජනා ක්‍රමයට අදාළ වන වෙනත් යම් කරුණු නිශ්චිතව සඳහන්ව තිබිය යුතු ය.

(3) එවැනි සෑම යෝජනා ක්‍රමයක් ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර, යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

(4) අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ඇතිව අදාළ විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින්, (1) වන උපවගන්තිය යටතේ නියමය කරනු ලැබූ සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමයක් සංශෝධනය කරනු ලැබිය හැකි ය. මේ වගන්තියේ (3) වන උපවගන්තියේ සඳහන් විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව එවැනි සෑම සංශෝධනයක් සඳහා ම අදාළ විය යුතු ය.

10. (1) නියම කරනු ලැබිය හැකි යම් කාර්ය පටිපාටියක් අනුගමනය කරමින් මණ්ඩලය විසින් තේරීම් කමිටු පත් කළ යුතු ය. තේරීම් කමිටු.

(2) 7 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ මණ්ඩලයට ඉදිරිපත් කර ඇති ප්‍රකාශනවල අන්තර්ගත ප්‍රකාශවල නිරවද්‍යතාව සහ 7 වන වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාරව යම් තැනැත්තකු විසින් මණ්ඩලයට ලැබීමට සලස්වා ඇති යම් නිවේදනයක නිරවද්‍යතාව පරීක්ෂා කිරීම සහ නිශ්චය කර ගැනීම (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද තේරීම් කමිටුවක කාර්යය විය යුතු ය.

(3) තේරීම් කමිටුව විසින්, එය වෙත ඉදිරිපත් කර ඇති ප්‍රකාශන විමසා බැලීමෙන් පසුව සහ එය විසින් අවශ්‍ය යයි සලකන්නා වූ යම් විමසීම් සිදු කරනු ලැබීමෙන් පසු යම් නියමිත පුඛපාටක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමයක් ප්‍රකාරව පුඛපාටක ප්‍රතිලාභ ලැබීම පිණිස ඔවුන්ගේ මතය අනුව සුදුසුකම් ලබා තිබෙන තැනැත්තන්ගේ නම් ඇතුළත් ලැයිස්තුවක් මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු ය.

11. (1) 10 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ලැයිස්තුව තමා වෙත ලැබීමෙන් පසු සහ එය මණ්ඩලය විසින් අනුමත කිරීමෙන් පසුව, ඒ ලැයිස්තුවල ඇතුළත් කර ඇති නාමවලට විරෝධතා හෝ ඒ ලැයිස්තුවල ඇතුළත් කළ යුතු වූ හිමිකම්පෑම්, දැන්වීම පළකිරීමේ දිනයේ සිට දින දහයක කාලසීමාවක් ඇතුළත ඉදිරිපත් කරන ලෙස තැනැත්තන්ට නියම කරමින්, ඒ නම් ලැයිස්තු ඇතුළත් දැන්වීම් සිංහල හා දෙමළ භාෂාවලින් දිනපතා පුවත්පත් දෙකක පළකිරීමට සැලැස්විය යුතු ය. විරෝධතා.

(2) (1) වන උපවගන්තිය යටතේ පළකරනු ලැබූ දැන්වීමට යම් ප්‍රතිචාරයක් ලැබීමෙන් පසු පරීක්ෂණයක් පවත්වා අවශ්‍යතාවෝචිත පරිදි සහ ඉන්පසු ඒ විරෝධතාව හෝ හිමිකම්පෑම සම්බන්ධයෙන් තීරණයකට එළඹෙන ලෙස මණ්ඩලය විසින් කොමසාරිස්වරයාට නියම කරනු ලැබිය යුතු ය.

12. (1) 11 වන වගන්තිය යටතේ පළ කරන ලද දැන්වීමට ප්‍රතිචාර වශයෙන් ලැබෙන විරෝධතා හෝ හිමිකම්පෑම් පිළිබඳව විශ්ලේෂණ පැවැත්වීම සඳහා සාදන ලද නියෝගවලට අනුකූලව මණ්ඩලය විසින් අභියාචන කමිටු පත් කළ යුතු ය. අභියාචන කමිටු.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද සෑම අභියාචනා කමිටුවක් වෙත යොමු කරන ලද යම් කරුණක් පිළිබඳව අවස්ථානුකූලව අවශ්‍ය යයි සලකනු ලබන යම් පරීක්ෂණයක් සහ විමර්ශනයක් අවසානයේ දී යොමු කිරීමෙන් දින තිහක් ඇතුළත දී එම කරුණ සම්බන්ධයෙන් වූ ස්වකීය තීරණය සෑම අභියාචනා කමිටුවක් ම මණ්ඩලය වෙත දැනුම්දිය යුතු ය.

අතිරේක තොරතුරු.

13. (1) මණ්ඩලය විසින් බලය දෙන ලද යම් නිලධරයකු විසින්, 7 වන වගන්තියේ (3) වන උපවගන්තිය ප්‍රකාරව දෙන ලද ප්‍රකාශනයක ඇතුළත් වන තොරතුරු හෝ 7 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලය වෙත සපයන ලද තොරතුරය ඇතුළත් වන කරුණුවල නිරවද්‍යතාව ස්ථිර ලෙස දැනගැනීමේ කාර්ය සඳහා, ඔහු විසින් තත් කාර්යය සඳහා අවශ්‍ය යයි සලකනු ලබන යම් අතිරේක තොරතුරු ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

(2) එම අතිරේක තොරතුරු සඳහන් කර ඇති කාලය ඇතුළත සැපයීම (1) වන උපවගන්තිය යටතේ අතිරේක තොරතුරු සපයන ලෙස නියම කරනු ලැබූ යම් තැනැත්තකුගේ කාර්යය විය යුතු ය.

අසත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම වරදක් බව.

14. (1) 7 වන වගන්තියේ (3) වන උපවගන්තිය ප්‍රකාරව දෙන ලද ප්‍රකාශනයක ඇතුළත් තොරතුරු හෝ 7 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලය වෙත සපයන ලද තොරතුරු සම්පූර්ණයෙන්ම හෝ කොටසක් අසත්‍ය බව විශ්වාස කිරීමට කොමසාරිස්වරයාට හෝ කොමසාරිස්වරයා විසින් බලය දෙන ලද යම් නිලධරයකුට හේතු ඇති අවස්ථාවක, ඔහු විසින්, සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීමට සුදුසු තැනැත්තන්ගේ ලැයිස්තුවෙන් ඒ තැනැත්තාගේ නම ඉවත් කිරීම මණ්ඩලය වෙත නිර්දේශ කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ නිර්දේශය මණ්ඩලය වෙත ලැබුණු විට, අවශ්‍ය යයි එය විසින් සලකනු ලබන විමසීම් කිරීමෙන් පසු, මණ්ඩලය විසින්, සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීමට සුදුසුකම් ඇති තැනැත්තන්ගේ ලැයිස්තුවෙන් ඒ තැනැත්තාගේ නම ඉවත් කොට ඒ බව ඒ තැනැත්තා වෙත ලියවිල්ලකින් දැනුම් දෙනු ලැබිය හැකි ය. තවද, මණ්ඩලය විසින් වහාම ක්‍රියාත්මක වන පරිදි ඒ තැනැත්තාට කරනු ලබන යම් ගෙවීමක් නතර කරනු ලැබිය යුතු අතර, ඒ තැනැත්තාට

කිසියම් ප්‍රතිලාභයක් ගෙවා ඇති අවස්ථාවක, එම ප්‍රතිලාභය, ඒ කාර්යය සඳහා නිශ්චිතව සඳහන් කරනු ලබන කාලයක් ඇතුළත දී මණ්ඩලය වෙත ආපසු ගෙවන ලෙස ඒ තැනැත්තාට නියම කරනු ලැබිය යුතු ය.

ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ කාර්ය.

15. තමාගේ කොට්ඨාසය තුළට ගැනෙන තේරීම් කමිටු විසින් ඔවුන්ගේ කාර්යයන් මේ පනතේ විධිවිධානවලට අනුකූලව හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගවලට අනුකූලව කරගෙන යන බවට සෑම ප්‍රාදේශීය ලේකම්වරයකු ම වග බලාගත යුතු ය.

පැහැරහරිනු ලැබූ විට කාර්ය පටිපාටිය.

16. (1) 14 වන වගන්තිය ප්‍රකාරව තමාට කරන ලද ගෙවීමක් ආපසු ගෙවන ලෙස නියම කරනු ලැබ නිශ්චිතව සඳහන් කළ කාලය තුළ දී එසේ කිරීමට අපොහොසත් වන යම් තැනැත්තකු එම මුදල පැහැරහරිනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර ඔහු මේ පනතේ කාර්ය සඳහා පැහැරහරින්නකු ලෙස සැලකිය යුතු ය.

(2) යම් මුදලක් පැහැරහරිනු ලැබ ඇති අවස්ථාවක, කොමසාරිස්වරයා විසින්, පැහැරහරින්නා පදිංචිව සිටින්නේ හෝ පැහැරහරින්නාට අයත් යම් නිශ්චල දේපළක් පිහිටියේ හෝ කවර මහේස්ත්‍රාත්වරයකුගේ අධිකරණ බලප්‍රදේශයක් ඇතුළත ද ඒ බලප්‍රදේශයේ මහේස්ත්‍රාත්වරයා වෙත, පැහැරහරින්නාගේ නම සහ පැහැරහරිනු ලැබූ මුදල් ප්‍රමාණය පිළිබඳ විස්තර අන්තර්ගත සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය. සහතිකය නිකුත් කිරීම පිළිබඳ නිවේදනයක් කොමසාරිස්වරයා විසින් පැහැරහරින්නා වෙත භාර කිරීමට හෝ ලියාපදිංචි තැපෑලෙන් පැහැරහරින්නා වෙත යැවීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය :

එසේ වුවද, එම නිවේදනය පැහැරහරින්නා වෙත ලැබී නොතිබීම, මේ වගන්තියෙහි මෙහි මින් මතු විධිවිධාන සලසා ඇති පරිදි පවරනු ලබන යම් ක්‍රියාමාර්ගයක් බලරහිත වීමට හේතු නොවිය යුතු ය.

(3) කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලබන සහතිකයේ අන්තර්ගත විස්තර සියලු කාර්යයන් සඳහා නිවැරදි බවට සලකනු ලැබිය යුතු අතර එය එම කාරණය සම්බන්ධයෙන් අවසාන සාක්ෂිය විය යුතු ය.

(4) (2) වන උපවගන්තිය ප්‍රකාර සහතිකය ලැබීමෙන් පසු මහෙස්ත්‍රාත්වරයා විසින්, තමා ඉදිරියේ පෙනී සිටින ලෙස පැහැරහරින්නා කැඳවිය යුතු අතර සහතිකයේ සඳහන් කර ඇති මුදල අයකර ගැනීම සඳහා වූ නීතිකෘත්‍ය ඔහුට විරුද්ධව කරගෙන නොයා යුත්තේ කුමක් නිසා ද යන වගට නිදහසට කරුණු දක්වන ලෙස ඔහුට නියම කළ යුතු ය. ප්‍රමාණවත් හේතු දැක්වීමක් ඉදිරිපත් නොවීමක දී, එම මුදල, දඩයකින් පමණක් දඬුවම් කළ හැකි සහ සිර දඬුවමකින් දඬුවම් කළ නොහැකි වරදක් සඳහා පැහැරහරින්නා වෙත මහෙස්ත්‍රාත්වරයකු විසින් පනවන ලද දඩයක් ලෙස සලකනු ලැබිය යුතු ය. ඉනික්බිති, එවැනි වරදක් සඳහා පනවන ලද දඩයක් ගෙවීම පැහැරහැරීමට අදාළ, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ (291 වන වගන්තියේ, (1) වන උපවගන්තියේ (අ), (ආ) සහ (ඒ) ඡේද හැර) එම වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන අදාළ විය යුතු අතර, ඒ දඬුවම පනවන අවස්ථාවේ දී, ඒ උපවගන්තියේ විධිවිධානවලින් මහෙස්ත්‍රාත්වරයා විසින් කරනු ලැබිය හැකි යම් විධානයක් මහෙස්ත්‍රාත්වරයා විසින් කරනු ලැබිය හැකි ය.

මණ්ඩලය විසින් බැංකු ගිණුම් ආදිය පවත්වාගෙන යාම හා ක්‍රියාත්මක කිරීම.

17. (1) මේ පනත යටතේ ස්වකීය කර්තව්‍ය නිසි ලෙස ඉටුකිරීම සඳහා අවශ්‍ය යයි එය විසින් සලකන පරිදි බැංකු ගිණුම් විවෘත කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිණිස මණ්ඩලයට බලය තිබිය යුතු ය.

(2) ඒ බැංකු ගිණුම් විවෘත කළ හැක්කේ සහ ක්‍රියාත්මක කළ හැක්කේ කවර තැනැත්තන් විසින් ද ඒ තැනැත්තන් මණ්ඩලය විසින් නම් කරනු ලැබිය හැකි ය.

(3) මණ්ඩලය සතු යම් අතිරික්ත මුදල් එය විසින් උචිත යයි සලකනු ලබන ආයෝජනවල ආයෝජනය කරනු ලැබිය හැකි ය. මණ්ඩලය එහි අභිමතය පරිදි ඒ ආයෝජන වෙනස් කිරීම හෝ අවසන් කිරීම කරනු ලැබිය හැකි ය.

මණ්ඩලයේ ගිණුම්.

18. (1) මණ්ඩලය විසින් මණ්ඩලයේ ආදායම් සහ වියදම්, වත්කම් සහ බැරකම් සහ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් පවත්වාගෙන යාමට කටයුතු සැලැස්විය යුතු ය.

(2) මණ්ඩලයේ මුදල් වර්ෂය දින් වර්ෂය විය යුතු ය.

(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන මණ්ඩලයේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

19. මණ්ඩලයේ සියලු වියදම් සහ යම් පුබපාටක ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් යටතේ පුබපාටක ප්‍රතිලාභ ගෙවීම සඳහා අවශ්‍ය වන මුදල් ඒකාබද්ධ අරමුදලට වැයබරක් විය යුතු ය. මණ්ඩලයේ වියදම්.

20. (අ) 7 වන වගන්තියේ (3) වන උපවගන්තිය ප්‍රකාරව අසත්‍ය හෝ වැරදි ප්‍රකාශනයක් හෝ 7 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අසත්‍ය හෝ වැරදි තොරතුරු සපයන යම් තැනැත්තෙක් ; වැරදි.

(ආ) 7 වන වගන්තියේ (3) වන උපවගන්තිය ප්‍රකාරව යම් තැනැත්තකු විසින් කරන ලද ප්‍රකාශනයක අන්තර්ගත වැදගත් විස්තරවල හෝ 7 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වූ තොරතුරුවල යම් වැදගත් වෙනස්වීමක් කොමසාරිස්වරයා වෙත දැනුම්දීමට අපොහොසත් වන යම් තැනැත්තෙක් ;

(ඇ) 11 වන වගන්තිය ප්‍රකාරව පළකරන ලද දැන්වීමකට ප්‍රතිචාර වශයෙන් අසත්‍ය හෝ වැරදි තොරතුරු සපයන යම් තැනැත්තෙක් ;

(ඈ) මේ පනත යටතේ ස්වකීය කාර්ය ඉටුකිරීමෙහි යෙදී සිටින යම් තැනැත්තකුට බාධාකරන හෝ තර්ජනාකාරයකින් හෝ අයුතු ලෙස මැදිහත් වන හෝ බලපෑම් කරන නැතහොත් තර්ජනාකාරයකින් හෝ බාධාකිරීමට හෝ අයුතු මැදිහත්වීමට හෝ බලපෑම් කිරීමට තැත් කරන යම් තැනැත්තෙක් : හෝ

(ඉ) පනත යටතේ සාදන ලද යම් නියෝගයක් අනුව ක්‍රියා කිරීමට අපොහොසත් වන යම් තැනැත්තෙක්,

මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමෙන් පසු රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට හෝ අවුරුදු එකකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

*රාජ්‍ය නිලධරයන් විසින් කරනු ලබන වැරදි.*

21. මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී හෝ කාර්ය හෝ කර්තව්‍ය ඉටුකිරීමේ දී දැන දැනම හෝ හිතාමතාම, උපාය හෝ වැරදි යම් තොරතුරක් මත ක්‍රියා කරන යම් රාජ්‍ය නිලධරයකු වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වන ලද සුළු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමෙන් පසු රුපියල් දස දහසකට නොවැඩි දඩයකට හෝ අවුරුදු එකකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

*වැරදි ගෙවීම්වල දී ආපසු අයකර ගැනීම.*

22. නිලධරයා වෙත හෝ කමිටුව වෙත ඉදිරිපත් කරන ලද ලියවිල්ලක අන්තර්ගත යම් ප්‍රකාශයක අව්‍යාජත්වය නිශ්චය කර ගැනීමට මණ්ඩලයේ යම් නිලධරයකු හෝ යම් සෙවීම් කමිටුවක සාමාජිකයකුට නොහැකි වූ විට සහ එහි ප්‍රතිඵලය වශයෙන් වැරදි සුබසාධක ප්‍රතිලාභ ගෙවීමක් කරනු ලැබ ඇති විට එම මුදල රජයට අය විය යුතු ණයක් ලෙස එම නිලධරයාගෙන් හෝ සාමාජිකයන්ගෙන් අයකර ගත යුතු ය.

*සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීමට සුදුසුකම් ඇති තැනැත්තන්ගේ ලැයිස්තුවෙන්, නම් අත්හැර දැමීම සහ එකතු කිරීම.*

23. නියමිත උපමානවලට අදාළව මණ්ඩලයේ මතයට අනුව සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීමට සුදුසුකම් ලබන හෝ සුදුසුකම් නොලබන තැනැත්තන්ගේ නම්, අවස්ථාවෝචිත පරිදි, එම ලැයිස්තුවලට ඇතුළත් කිරීමෙන් හෝ අත්හැර දැමීමෙන් සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීම පිණිස සුදුසුකම් ඇති තැනැත්තන්ගේ නම් ලැයිස්තු අවුරුද්දකට වරක් යාවත් කිරීමට සැලැස්වීම ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ කාර්යය විය යුතු ය.

*හදිසි සහන.*

24. ස්වාභාවික හෝ මනුෂ්‍යයන් විසින් ඇති කරන ලද ව්‍යසනයන් සිදුව ඇති බව සහ එයින් විපතට පත්වූවන්හට තාවකාලික ස්වභාවයේ හදිසි සහන සලසා දිය යුතු බව ස්වකීය මතය වන විට, කොමසාරිස්වරයා විසින් මණ්ඩලයේ පූර්ව අනුමතය ඇතිව මේ පනත යටතේ කරනු ලබන සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් එවැනි තැනැත්තන් වෙත ව්‍යාප්ත කරනු ලැබිය හැකි ය. එවැනි තැනැත්තන් තාවකාලිකව, මේ පනත ප්‍රකාරව සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලැබීමට සුදුස්සන් විය යුතු ය :

එසේ වුවද, මේ වගන්තිය ප්‍රකාර ව්‍යාප්ත කරන ලද හදිසි සහන කවර හේතුවක් නිසා හෝ එක් අවුරුද්දක් ඉක්මවා දීර්ඝ නොවිය යුතු ය.

**අමාත්‍යවරයා විසින් විධාන නිකුත් කිරීම.**

25. මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් කලින් කල මණ්ඩලය වෙත ලියවිල්ලකින් වූ සාමාන්‍ය හෝ විශේෂ විධාන නිකුත් කරනු ලැබිය හැකි ය. ඒ විධාන අනුව ක්‍රියා කිරීම මණ්ඩලයේ කාර්යය විය යුතු ය.

**මණ්ඩලයේ තීරණවල අවසානාත්මක බව.**

26. මණ්ඩලයේ සෑම තීරණයක් ම සහ තේරීම් කමිටුවක් විසින් මණ්ඩලයට කරන ලද සෑම නිර්දේශයක් සහ අභියාචන කමිටුවක් විසින් කරන ලද සෑම තීරණයක් ම අවසානාත්මක සහ තීරණාත්මක විය යුතු ය.

**නියෝග.**

27. (1) මේ පනතේ මූලධර්ම සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා සහ මේ පනතින් නියම කරනු ලැබිය යුතු යයි නියම කර ඇති හෝ බලය දී ඇති යම් කරුණු සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙන් පවරන ලද බලතලවල ව්‍යාප්තියට අගතියක් නොවන පරිදි පහත දැක්වෙන සියලු කාරණා හෝ යම් කාරණයක් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය :-

(අ) සුබසාධක ප්‍රතිලාභ ගෙවීම සඳහා කොමසාරිස්වරයා වෙත ඉල්ලීමක් කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සහ භාවිත කළ යුතු ආකෘති වේ නම් ඒ ආකෘති ;

(ආ) මේ පනත අදාළ වන තැනැත්තන් තෝරා ගැනීමේ දී සහ සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රමය ;

(ඇ) සුබසාධක ප්‍රතිලාභ ප්‍රදානය සඳහා ඉල්ලුම් කරන තැනැත්තන් විසින් ඉටු කළ යුතු කොන්දේසි ;

(ඈ) මේ පනත අදාළ වන තැනැත්තන් සම්බන්ධයෙන් අදාළ කරගනු ලැබිය යුතු කොන්දේසි ;

(ඉ) තේරීම් කමිටුවල සහ අභියාචන කමිටුවල සංයුතිය සහ ඒ කමිටුවලට පත්කිරීම් කරනු ලැබිය යුතු ආකාරය සහ එම කමිටු විසින් අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය ;

(ඊ) මේ පනත අදාළවන තැනැත්තකු ලෙස යම් තැනැත්තකුගේ නම ඇතුළත් කිරීමට විරෝධතා සහ 11 වන වගන්තිය යටතේ පළකරන ලද ලැයිස්තුවල ඇතුළත් වීම සඳහා තැනැත්තන් විසින් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය ;

(උ) මණ්ඩලයේ නිලධරයන් සහ කමිටුවල සාමාජිකයන් වෙත කරන ලද ප්‍රකාශනවල අන්තර්ගත ප්‍රකාශවල නිරවද්‍යතාව නිශ්චය කර දැනගැනීමට අපොහොසත් වීම පිළිබඳව මණ්ඩලයේ නිලධරයන්ට සහ කමිටුවල සාමාජිකයන්ට විරුද්ධව පරීක්ෂණ ආරම්භ කිරීම සහ පැවැත්වීම.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලබන දිනයේ දී හෝ නියෝගයෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන වෙනත් යම් පසු දිනයක දී ක්‍රියාත්මක විය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම එය ගැසට් පත්‍රයේ පළකිරීමෙන් පසු හැකිතාක් ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් ඒ අනනුමතයේ දින සිට එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැතිව පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(5) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකන ලද දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

28. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි–

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VIIඅ පරිච්ඡේදය යටතේ පත් කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අදහස් වේ :

"අමාත්‍යවරයා" යන්නෙන්, මේ පනතේ කාර්ය සඳහා මුදල් විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ :

"සුබසාධක ප්‍රතිලාභ ගෙවීම" යන්නෙන්, සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් ප්‍රකාරව මේ පනත අදාළවන තැනැත්තකුට හිමිකම් ඇති ගෙවීමක් අදහස් වේ ;

"සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය" යන්නෙන්, පනතේ 9 වන වගන්තිය යටතේ සකස් කරන ලද යෝජනා ක්‍රමයක් අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට මේ පනත බලපැවැත්විය යුතු බව.

29. (1) දරිද්‍රතාවය තුරන් කිරීම පිණිස හෝ සුභ සාධක සහන ප්‍රතිලාභයක් වශයෙන් හෝ වෙනත් යම් සමාන කාර්යයක් සඳහා යම් දීමනාවක් හෝ ගෙවීමක් ගෙවනු ලබන්නේ වෙනත් යම් නීතියක් යටතේ ද එම නීතියේ විධිවිධාන සහ මේ පනතේ විධිවිධාන අතර යම් අනනුකූලතාවක් ඇති අවස්ථාවක දී මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් එවැනි යම් නීතියක, එවැනි යම් කරුණක් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා නිශ්චිත විධි විධානයක් හෝ බලාත්මක විධිවිධානයක් නොමැති අවස්ථාවක දී මේ පනතේ විධිවිධාන ඒ කරුණ සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

30. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1,160 යි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා එවා ලබාගත හැකිය.